<u>රත්නපුරය දක්වා නැවත දුම්රිය ධාවනය ඇරඹීම</u>

මේ සඳහා පැරණි දුම්රිය මග වෙනුවට, පාදුක්ක හා ඉංගිරිය හරහා නව මාර්ගයක් යෝජනා වී ඇති හෙයින්, පහත කරුණුද ඔබ තුමාගේ අවධානයට ලක් වන්නේ නම් මැනවි.

1) පැරණි දුම්රිය මගෙහි අවිස්සාවේල්ල සිට රත්නපුර දක්වා දුර - සැතපුම් 27[1]
පාදුක්ක සිට ඉංගිරිය හරහා රත්නපුර දක්වා දුර - සැතපුම් 33[2]

=> යෝජනා වී ඇති අළුත් මග දිගේ රත්පුරයට නැවත දුම්රිය ධාවනය කිරීමට සැතපුම් 6 ක් වැඩියෙන් දුම්රිය මාර්ගය ඉදි කල යුතුය.

=> තවද, මෙලෙස ඉදිකිරීමට පළමුව අළුත් මාර්ගය සමීක්ෂණය කොට, ශක්‍යතා අධ්‍යයනයක් සිදු කොට, අළුත් ඉඩම් පවරා ගත යුතුය. එහෙත් පැරණි මාර්ගයේ අවිස්සාවේල්ලේ සිට ඇහැලියගොඩ හරහා රත්නපුරයට නැවත මාර්ගය ඉදිකරන්නේ නම්, අනවසර පදිංචි කරුවන් (වන්දියක් ලබා දී හෝ) ඉවත් කිරීම පමණක් සෑහේ. අවශ්‍ය නම් ඇහැලියගොඩ, කුරුවිට හා රත්නපුර යන නගරාසන්නවල පමණක් දුම්රිය මාර්ගය මඳක් ඉවතට ගත හැක.

2) කෙසේ වෙතත්, කුමන දිශාවකින් රත්නපුර දක්වා මග ඉදි කලත්, මරදාන-පාදුක්ක-(අවිස්සාවේල්ල) දක්වා මාර්ගය වංගු ඉවත් කොට නැවත ඉදි කල යුතුය. අධිවේගී දුම්රිය මාරගයක් සඳහා අවශ්‍ය වේගය කිසිවිටකත් පවතින මාරගය මතදී ලබා ගත නොහැක.

මේ උදෙසා බේස්ලයින් පාර, නාරාහේන්පිට, නුගේගොඩ, මහරගම ආදී පෙදෙස් වලදීද අනවසර පදිංචි කරුවන් ඉවත් කල යුතුය. රත්නපුරයේදී අනවසර පදිංචි කරුවන්ගේ අවශ්‍යතාව මත මාර්ගය වෙනස් කල හොත් , මෙම අනවසර පදිංචි කරුවන්ගේ ඉල්ලීම් වලටද අවනත විය යුතු තත්ත්වයක් උදවේ. එසේ නොවුවහොත් එය ඉතාම පරස්පර විරෝධී තත්ත්වයක් උද්ගත කරයි.

3) නොරොච්චෝලෙයි, වීරවිල ගුවන් තොටුපොළ ඉදි කිරීම යනාදියෙහිදී (ජාතික අවශ්‍යතා වෙනුවෙන්) දැක් වූ නම්‍යශීලී ප්‍රතිපත්තිය මෙහිදීද දැක්විය හැකි නම් මැනවි.

4) අළුත් මගක් තෝරා ගැනීම මගින්, කරමාන්ත පුරවරයක් ආසන්නයේ වූ අවිස්සාවේල්ල හුදකලාවූ ගමනාන්තයක් වීම.

5) එරත්න හරහා සිරිපා මළුව දක්වා ගමන හා බෝපත් ඇල්ල වැනි ආකරෂණීය චාරිකා සඳහා දුම්රිය මගින් ගමන් පහසුව සලසා ගත නොහැකි වීම. සති අන්ත වලදී, කොළඹ සහ අවට ප්‍රදේශවල සිට අතිමහත් ජනකායක් ඇල්ල නැරඹීමට පැමිණේ.


6) යෝජනා කොට ඇති නව මාරගයේ ඉංගිරිය - රත්නපුර කොටස නිතර ජල ගැලීම් සිදු වන ද්‍රෝණියක පිහිටා ඇත. අළුතින් දුම්රිය මාරග තැනීමේදී, ස්වභාවික උපද්‍රව වලින් මාරගයට නිතර හානි වීමට ඇති ඉඩකඩ පිළිබඳවද සොයා බැලේ. උදහරණයක් ලෙස, ගම්පොළ හරහා උඩරට මාර්ගය තැනීමේදී සිදු කල අධ්‍යයනයන් දැක් විය හැක.

---

[1] ඇමුණුම් 1 හා 2 බලන්න (Dr. David Hyatt, RAILWAYS OF SRI LANKA)


[2] ඇමුණුම් 3 හා 4 බලන්න (විජය මාර්ගෝපදේශකය, විජය මුද්‍රණාලය, මරදාන)

## ඇමුණුම් 1, 2




| Padukka X | | | |
|---|---|---|---|
| Pinnawala | PNW | 24:76 | |
| Morakelle | MKP | 26:20 | |
| Waga X | WGG | 27:47 | |
| Kosgama | KSG | 30:58 | |
| Puwakpitiya | PWP | 34:42 | |
| AVISSAWELLA X | AVS | 36:69 | |
| **Pelmadulla (Ratnapura) Line [dismantled]** | | | |
| Getahetta | GTH | 40:66 | |

[1] Line number 9.
[2] All locations which are known to have or to have had crossing loc… were both added and removed; narrow-gauge trains now operate … crossing loops which can still accommodate narrow gauge trains is l…
[3] From KV mileage origin, 4 chains east of Maradana station.



| Station X = crossing station[2] | Code | Distance (mc)[3] | Distance (km)[4] |
|---|---|---|---|
| Beruwana | BRP | 43:36 | [70.00] |
| Eheliyagoda X | EHY | 45:67 | [73.83] |
| Parakaduwa X | PKD | 50:39 | [81.31] |
| Miniripitiya | MNP | 51:76 | [83.68] |
| Kuruwita X | KWT | 56:23 | [90.65] |
| Palm Garden | PGP | 61:41 | [99.07] |
| RATNAPURA X | RPR | 63:58 | [102.61] |
| Tiriwanaketiya | TRK | 66:21 | [106.70] |
| Dela X | DAL | 70:36 | [113.43] |
| Erraboda | ERP | 72:31 | [116.57] |
| Kiribatgala | KRP | 74:36 | [119.89] |


## ඇමුණුම් 3, 4



කොළඹ සිට ඉංගිරිය

| | සැ. | කි.මී. | |
|---|---|---|---|
| හෝමාගම | 15 | 24.14 | |
| ගොඩගම | 18 | 28.96 | - |
| මීගොඩ | 19 | 30.57 | - |
| " | | | - |
| පාදුක්ක | 22 | 35.40 | - |
| " | | | - |
| " | | | - |
| බෝපේ | 25 | 40.23 | |
| හඳපාන්ගොඩ | 29 | 46.66 | - |
| ඉංගිරිය | 33 | 53.10 | |

64



| | සැ. | [illegible] | |
|---|---|---|---|
| | 12 | 19.31 | - |
| හොරණ | 16 | 25.74 | - |
| කළුපහන | 20 | 32.18 | - |
| ඉංගිරිය | | | - |
| " | | | |
| නම්බපාන | 25 | 40.23 | - |
| කිරිඇල්ල | 31 | 49.88 | - |
| ඉඩම්ගොඩ | 32 | 51.49 | - |
| දොඩම්පෙ | 36 | 57.92 | - |
| කහංගම | 40 | 64.36 | - |
| රත්නපුර | 42 | 67.58 | |

උතුරු කළුතර සිට හෙ…


Haritha Waidyaratne
INDUSTRIAL & FINANCIAL SYSTEMS IFS

501 Galle Road, Colombo 6, Sri Lanka
Tel +94 (011) 2 36 44 00
Fax +94 (011) 2 36 44 01
Email : haritha.waidyaratne@ifs.lk
Official : www.ifsworld.com
Personal : www.geocities.com/RainForest/9157